# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1992 අංක 13 දරන ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 මාර්තු මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : රු. 1.20 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1992 අංක 13 දරන ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 40/90

**ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 2 දරන ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1992 අංක 13 දරන ජාතික ජලම්පාදන සහ ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත නමින් හැඳින්වෙන අතර එය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක දී ක්‍රියාත්මක වන්නේ ය. **ප්‍රකුබූ නාමය සහ ක්‍රියාත්මක වන දිනය.**

2. (මෙහි මින්මතු " ප්‍රධාන ප්‍රඥප්තිය " යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩල පනතේ 25 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:— **ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 2 දරන** ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩල පනතේ 25 වන **වගන්තිය** ප්‍රතියෝජනය කිරීම.

" පොදු ජල කරාම.

25. යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමා ඇතුළත නිශ්චිත යම් ස්ථානයක පොදු ජල කරාම ඉදිකිරීම සඳහා එම පළාත් පාලන ආයතනය මණ්ඩලයෙන් ඉල්ලා සිටින අවස්ථා වක, මණ්ඩලය විසින් එම ජලකරාම සවි කළ යුතු අතර, එසේ සවිකිරීමේ දී දරන ලද වියදම්, ඉල්ලීම කරන ලද පළාත් පාලන ආයතනයෙන් ලබා ගත යුතු ය. ඒ ජලකරාමවලින් සපයනු ලබන ජලය සම්බන්ධයෙන් වන ජල ගාස්තු ඉල්ලීම කරන පළාත් පාලන ආයතනයෙන් මණ්ඩලය විසින් අයකර ගත යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 25අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:— **ප්‍රධාන ප්‍රඥප්තියට 25 අ වන වගන්තිය ඇතුළත් කිරීම.**

" පයිප්ප වැඩ සහ ජලාපවහන පිළිබඳ අවශ්‍යතාවලට අනුකූල බවට සහතිකය.

25අ. (1) මේ වගන්තිය ක්‍රියාත්මක වීමේ දින හෝ එදිනට පසුව ඉදිකරන ලද ගොඩනැගිල්ලක හෝ ස්ථානයක අභ්‍යන්තර පයිප්ප වැඩ සහ ජලාපවහන ක්‍රමය මණ්ඩලය විසින් නියම කර ඇති අවශ්‍යතාවලට අනුකූල වන බවට වූ සහතිකයක් එම ගොඩනැගිල්ල සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන තෙක් රැකබලාගන්නා හැර වෙනත් කිසිම තැනැත්තෙක් එම ගොඩනැගිල්ලේ හෝ ස්ථානයේ පදිංචි නොවිය යුතු ය.

(2) යම් ගොඩනැගිල්ලක් ඉදිකරනු ලැබූ යම් තැනැත්තකු විසින්, එවැනි සහතිකයක් සඳහා ලිඛිතව ඉල්ලුම් කළ හැකි අතර මණ්ඩලය විසින්, අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි පරීක්ෂණයකින් පසුව ඉල්ලීම ලැබී දින විසි එකක් ඇතුළත සහතිකය ලබා දිය යුතු ය ; නැතහොත් එය ලබා දීම මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරන බව ද එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතු ද ඉල්ලුම්කරුට දැන්විය යුතු ය.

(3) මේ වගන්තිය උල්ලංඝනය කරමින් යම් ගොඩනැගිල්ලක හෝ ස්ථානයක පදිංචි වන හෝ පදිංචිවීමට ඉඩ දෙන සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන අතර, උල්ලංඝනය කිරීම සිදුවෙමින් පවතින එක් එක් දිනය සඳහා දිනකට රුපියල් දෙසිය පනහ නොඉක්මවන දඩයකට ඔහු යටත් වන්නේ ය. ”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියේ ඇති “ පෙරවරු අට සහ පස්වරු පහ ” යන වචන වෙනුවට “ පෙරවරු හය සහ පස්වරු හය ” යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 27අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 27අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

“ අවසර නොලත් සම්බන්ධ කිරීම සම්බන්ධයෙන් සාමාන්‍යාධිකාරීවරයාට ඇති බලය.

27අ. (1) මේ නීතිය යටතේ ජලය සපයා ඇත්තා වූ හෝ එසේ කර නොමැත්තා වූ යම් ගොඩනැගිල්ලකට හෝ ස්ථානයකට අනවසර ජලසැපයීම් සම්බන්ධ කර ඇත්දැයි තීරණය කිරීමට අවශ්‍ය වන යම් පරීක්ෂණයක් කිරීම සඳහා එහි අයිතිකරුට පැයකට නොඅඩු කාලයක, දැනුම් දීමකින් පසුව පෙරවරු හයේ සිට පස්වරු හය දක්වා වූ කාලය ඇතුළත සාමාන්‍යාධිකාරීවරයාට හෝ තත් කාර්ය සඳහා ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් තැනැත්තකුට එවැනි ගොඩනැගිල්ලකට හෝ ස්ථානයකට ඇතුළු විය හැකි ය.

(2) සාධාරණ හේතුවක් නොමැතිව—

(අ) (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති කාර්ය සඳහා, සාමාන්‍යාධිකාරීවරයා හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද තැනැත්තකු ඇතුළු කර ගැනීමට ප්‍රතික්ෂේප කරන ; හෝ

(ආ) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත පවරනු ලැබ ඇති කාර්ය ඉටු කිරීමේ දී, එම සාමාන්‍යාධිකාරීවරයාට හෝ තැනැත්තාට බාධා කරන

යම් තැනැත්තකු මේ නීතිය යටතේ වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී රුපියල් පන්දහසක දඩයකට යටත් වන්නේ ය.

(3) එම ගොඩනැගිල්ලට හෝ ස්ථානයට ජල සැපයීම ලැබී ඇත්තේ අවසර නොලත් සම්බන්ධ කිරීමකින් බවට පරීක්ෂණයෙන් පසු සාමාන්‍යාධිකාරිවරයාට හෝ තත්කාර්යය සඳහා ඔහු විසින් බලය පවරන ලද තැනැත්තාට පෙනී ගියහොත් එම ස්ථානයේ අයිතිකරුට විරෝධතා පළ කිරීමේ අවස්ථාවක් ලබා දීමෙන් පසුව, සාමාන්‍යාධිකාරිවරයා හෝ තත්කාර්යය සඳහා ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද තැනැත්තා විසින් ඒ සම්බන්ධ කිරීම ඉවත් කිරීම සඳහා සැලැස්විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ ඇති “රුපියල් සියයක් නොඉක්මවන” යන වචන වෙනුවට “රුපියල් දෙදහසක් නොඉක්මවන” යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ ඇති “රුපියල් විස්සක් නොඉක්මවන” යන වචන වෙනුවට “රුපියල් දෙදහසක් නොඉක්මවන” යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියේ ඇති “රුපියල් පනහක් නොඉක්මවන” යන වචන වෙනුවට “රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දස දහසකට නොවැඩි” යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තිය, එම වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ; සහ

(2) එම වගන්තියේ නැවත අංක යොදන ලද (1) වන උපවගන්තියේ ඇති “රුපියල් පනසක් නොඉක්මවන” යන වචන වෙනුවට “රුපියල් දෙදහසක් නොඉක්මවන” යන වචන ආදේශ කිරීමෙන් ;

(3) නැවත අංක යොදන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) ගින්නක් නිවීමේ කාර්ය සඳහා හැර වෙනත් කාර්යයන් සඳහා ගිනි නිවීමේ ජලෝද්ගම නලයක ඇති ජලය ප්‍රයෝජනයට ගන්නා සෑම තැනැත්තකු ම වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී රුපියල් පන්දහසකට අඩු නොවන සහ රුපියල් දස දහසකට වැඩි නොවන දඩයකට ඔහු යටත් වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ ඇති "රුපියල් සියයක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් පන්දහසකට අඩු නොවන සහ රුපියල් දස දහසකට වැඩි නොවන" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ ඇති රුපියල් සියයක් නොඉක්මවන දඩයකට" යන වචන වෙනුවට "රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ එක් අවුරුද්දකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තිය, එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ;

(2) එම වගන්තියේ නැවත අංක යොදන ලද (1) වන උපවගන්තියෙහි ඇති "උදේ අටේ සිට සවස පහ දක්වා වූ කාලය තුළ" යන වචන වෙනුවට "පෙරවරු හයේ සිට පස්වරු හය දක්වා වූ කාලය තුළ" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) අලුතින් අංක යොදන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) (1) වන උපවගන්තිය මගින් සාමාන්‍යාධිකාරිවරයා, ඔහුගේ අනුයෝජිතයා සහ කම්කරුවා වෙත පවරනු ලැබ ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී සාමාන්‍යාධිකාරිවරයාට හෝ ඔහුගේ අනුයෝජිතයාට හෝ කම්කරුවාට විරෝධය පාන හෝ බාධාකරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දස දහසකට නොවැඩි දඩයකට යටත් වන්නේ ය.".

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "රුපියල් පණහක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් දස දහසක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) "ඉහත අන්තිමට සඳහන් කරන ලද වරදක් කරන එක් එක් දිනය (දින එකකට වැඩි නම්) වෙනුවෙන් රුපියල් දහයක අතිරේක දඩයකට" යන වචන වෙනුවට "ඉහත අන්තිමට සඳහන් කරන ලද වරදක් කරන එක් එක් දිනය (දින එකකට වඩා වැඩි නම්) වෙනුවෙන් රුපියල් සියයක අතිරේක දඩයකට" යන වචන ආදේශ කිරීමෙන්.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ ඇති "රුපියල් එක් දහසක් නොඉක්මවන" යන වචනවල සිට එම වගන්තියේ අවසානය තෙක් ඇති වචන වෙනුවට, "රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දස දහසකට නොවැඩි දඩයකට සහ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයාගේ හෝ ඒ කාර්ය සඳහා සාමාන්‍යාධිකාරීවරයා විසින් ලිඛිතව බලය පවරනු ලැබූ වෙනත් යම් තැනැත්තකුගේ අත්සන යෙදූ දැනුම්දීමක් භාරදෙනු ලැබීමේ සිට පැය විසිහතරක් ඉකුත්වීමෙන් පසුව ඒ වරද තවදුරටත් කරගෙන යනු ලැබුවහොත් එසේ වරද සිදු කරන එක් එක් දිනය සඳහා දිනකට රුපියල් සියය බැගින් වූ දඩයකට ද ඔහු යටත් වන්නේ ය." යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(3) (2) වන උපවගන්තිය යටතේ සිය බලතල ක්‍රියාත්මක කරන සාමාන්‍යාධිකාරීවරයා හෝ තත් කාර්ය සඳහා ඔහු විසින් ලිඛිතව බලය පවරන ලද වෙනත් තැනැත්තකු වළක්වන හෝ ඔවුන්ට බාධා කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී රුපියල් එක් දහසකට අඩු නොවන දඩයකට යටත් වන්නේ ය.".

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියේ ඇති "රුපියල් සියයක් නොඉක්මවන දඩයකට" යන වචනවල සිට එම වගන්තියේ අවසානය තෙක් ඇති වචන වෙනුවට "රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත්වන අතර, ඒ වරද තවදුරටත් කරගෙන ගියහොත් ඒ වරදට වරදකරු කරනු ලැබූ දිනයෙන් පසුව එය තවදුරටත් කරනු ලබන කාල සීමාව සඳහා එක් එක් දිනයකට රුපියල් සියයකට වැඩි නොවන අතිරේක දඩයකට ද ඔහු යටත් වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තියේ (1) වන උප වගන්තියේ ඇති "රුපියල් සියයක් නොඉක්මවන දඩයකට" යන වචන වල සිට ඒ උපවගන්තියේ අවසානය තෙක් ඇති වචන සියල්ලම වෙනුවට "රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත්වන අතර, ඒ වරද තවදුරටත් කරගෙන ගියහොත් ඒ වරදට වරදකරු කරනු ලැබූ දිනයෙන් පසුව එය තවදුරටත් කරනු ලබන කාලසීමාව සඳහා එක් දිනයකට රුපියල් සියයකට වැඩි නොවන අතිරේක දඩයකට ද ඔහු යටත් වන්නේ ය.". යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියේ (2) වන උප වගන්තියේ ඇති "රුපියල් සියයක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් දෙදහසක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියේ (2) වන උප වගන්තියෙහි ඇති "රුපියල් දෙසිය පණහක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් දෙදහසක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තියේ (2) වන උප වගන්තියෙහි ඇති "රුපියල් සියයක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් දෙදහසක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තියේ (11) වන උප වගන්තියෙහි ඇති "රුපියල් පණහක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් දෙදහසක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (5) වන උපවගන්තියෙහි ඇති "රුපියල් සියයක් නොඉක්මවන දඩයකට" යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා ඇති වචන සියල්ලම වෙනුවට "රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් වන අතර එසේ වරදකරු කරනු ලැබීමෙන් පසුව ද එවැනි වැඩක් සඳහා අවසරය දීම ප්‍රතික්ෂේප කිරීම හෝ එවැනි වැඩක් වැළැක්වීම තවදුරටත් කරගෙන යන සෑම ඉඩම් අයිතිකරුවෙක්ම නොකඩවා කරගෙන යන වරදකට වරදකරු වන අතර, එකී වරද කරගෙන යන එක් එක් දවසට රුපියල් සියයක් නොඉක්මවන දඩයකට යටත් වන්නේය." යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (7) වන උපවගන්තියෙහි ඇති "රුපියල් සියයක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් දෙදහසක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන්.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තියේ (4) වන උප වගන්තියෙහි ඇති "රුපියල් සියයක් නොඉක්මවන දඩයකට" යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා ඇති සියලුම වචන වෙනුවට "රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් වන්නේ ය. වරදකරු කරනු ලැබීමෙන් පසුව ද එවැනි වැඩක් සඳහා අවසරය දීම ප්‍රතික්ෂේප කිරීම හෝ එවැනි වැඩක් වැළැක්වීම තවදුරටත් කරගෙන යන සෑම අයිතිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම, නොකඩවා කරගෙන යන වරදකට වරදකරු වන අතර, ඉහත සඳහන් පරිදි වරදකරු කරනු ලැබූ විට එකී වරද කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් සියයක් නොඉක්මවන දඩයකට යටත් වන්නේ ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය සංශෝධනය කිරීම.

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (4) වන උපවගන්තියෙහි ඇති "රුපියල් පණහක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් දෙදහසක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (6) වන උපවගන්තියෙහි ඇති "රුපියල් පණහක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් දෙදහසක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන්.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තියේ (2) වන උප වගන්තියෙහි ඇති "රුපියල් සියයක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් දෙදහසක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම.

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියෙහි (2) වන උප වගන්තියෙහි ඇති, "රුපියල් පණහක් නොඉක්මවන දඩයකට ඔහු යටත් වන්නේය." යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා ඇති සියලුම වචන වෙනුවට "රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දස දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් වන්නේ ය. තවද එසේ වරදකරු කිරීමෙන් පසුව, ඒ පැහැර හැරීම තවදුරටත් කරන හෝ ඒ දැන්වීමේ නියමයක් අනුව ක්‍රියා කිරීම නොසලකා හරින ඒ සෑම තැනැත්තෙක්ම දිගටම ඒ වරද කරන අතර ඉහත කී ලෙස වරදකරු කිරීමෙන් පසුව, එසේ වරද දිගටම කරන එක් එක් දවස සඳහා රුපියල් සියයකට නොවැඩි දඩයකට යටත් වන්නේ ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තියේ (1) වන උප වගන්තියෙහි ඇති “ රුපියල් පණහක් නොඉක්මවන දඩයකට ” යන වචනවල සිට එම වගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන වෙනුවට “ රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් වන්නේ ය. ඒ වරදට වරදකරු කරනු ලැබීමෙන් පසුව ද ඉහත කී යම් සෞඛ්‍යාරක්ෂක උපකරණයක් එවැනි සහතිකයක් හෝ අවසරයක් නොලබා පාවිච්චි කරන හෝ පාවිච්චි කිරීමට සලස්වන නැතහොත් පාවිච්චි කිරීමට ඉඩ හරින සෑම තැනැත්තෙක්ම නොකඩවා කරගෙන යන වරදකට වරදකරු වන අතර, ඉහත සඳහන් පරිදි වරදකරු කරනු ලැබූ විටක එකී වරද කරගෙන යන එක් එක් දවසට රුපියල් සියයක් නොඉක්මවන දඩයකට යටත් වන්නේ ය. ” යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය සංශෝධනය කිරීම.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තියේ (6) වන උප වගන්තියේ “ රුපියල් පණහක් නොඉක්මවන ” යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා ඇති වචන වෙනුවට “ රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් වන්නේ ය. ඒ වරදට වරදකරු කරනු ලැබීමෙන් පසුව ද එම උල්ලංඝනය කිරීම නොකඩවා කරගෙන යන සෑම තැනැත්තෙක්ම නොකඩවා කරගෙන යන වරදකට වරදකරු වන අතර ඉහත කී පරිදි වරද කරු කරනු ලැබූ විට එකී වරද කරගෙන යන එක් එක් දවසට රුපියල් සියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් වන්නේ ය. ” යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය සංශෝධනය කිරීම.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි ඇති “ රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ ” යන වචන වෙනුවට “ රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ ” යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම.

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියේ (5) වන උපවගන්තියෙහි ඇති “ රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ ” යන වචන වෙනුවට “ රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ” යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය සංශෝධනය කිරීම.

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තියේ (1) වන උපවගන්තියේ ඇති “ රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කරනු ලැබීම සහ දඩය යන දඬුවම් දෙකටම ” යන වචන වෙනුවට “ රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කරනු ලැබීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ ” යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය ඉවත් කිරීම.

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (1) වන උපවගන්තියෙහි ඇති "නියම කළ හැකි යම් බදු හෝ ගාස්තු" යන වචන වෙනුවට "මාපකයක් මගින් ජලය සැපයීම සඳහා වන ගාස්තු ද ඇතුළුව නියම් කළ හැකි බදු ගාස්තු" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එහි (6) වන උපවගන්තිය අත්හැරීමෙන්.

**33.** පහත දැක්වෙන අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තියට ඉක්බිතිවම මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒවා එම වගන්තියේ 84අ, 84ආ, 84ඇ, 84ඈ, 84ඉ, 84ඊ, 84උ, 84ඌ, 84එ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියට 84අ-84එ දක්වා වූ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"මණ්ඩලයෙන් ජලය සැපයීම මාපක මගින් විය යුතු බව.

84අ. මණ්ඩලය විසින් යම් ගොඩනැගිල්ලකට හෝ ස්ථානයකට ජලය සැපයීම මාපක මගින් විය යුතු බවට නියම කිරීමට මණ්ඩලයට හිමිකම් ඇති අතර 84(1) වගන්තියේ විධිවිධානවලට මණ්ඩලය මගින් ජලය සැපයීම සඳහා වූ ගාස්තු ද ඇතුළත් විය යුතු ය.

මාපක මගින් ජලය සැපයීම සඳහා වූ ගාස්තු

84ආ. (1) මණ්ඩලය විසින් යම් ගොඩනැගිල්ලකට හෝ ස්ථානයකට ජලය සැපයීම සම්බන්ධයෙන් අය කළ යුතු ගාස්තු තක්සේරු කිරීමේ කාර්ය සඳහා එසේ ජලය සපයනු ලබන යම් ගොඩනැගිල්ලක හෝ ස්ථානයක මණ්ඩලය විසින් ජල මාපක සවි කළ යුතු ය.

(2) මණ්ඩලය විසින් යම් ගොඩනැගිල්ලක හෝ ස්ථානයක ජල මාපකයක් සවිකර ඇති අවස්ථාවක දී, කිසිම ගෙවීමක් නොමැතිව එම ගොඩනැගිල්ලට හෝ ස්ථානයට ජලය සැපයීම සඳහා මණ්ඩලය විසින් භාරගන්නා ලද යම් බැඳීමක් නොතකා, එම ගොඩනැගිල්ලට හෝ ස්ථානයට සපයනු ලද ජලය සඳහා, මාපක මගින් ජලය සැපයීම සඳහා VI වන කොටස යටතේ නියම කර ඇති බදු හා ගාස්තුවලට අනුව මුදල් ගෙවීම සඳහා එම ගොඩනැගිල්ලේ හෝ ස්ථානයේ පදිංචිකරු යටත් වන්නේ ය.

**ජල මාපක සවි කිරීමට බාධා කිරීම වරදක් බව.**

84ආ. යම් ගොඩනැගිල්ලක හෝ ස්ථානයක ජල මාපකයක් සවි කිරීමේ දී, තත්කාර්ය සඳහා බලයලත් මණ්ඩලයේ යම් නිලධරයකුට සාධාරණ හේතුවක් නොමැතිව බාධා කරන හෝ ප්‍රතිරෝධය පාන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දස දහසකට නොවැඩි දඩයකට යටත් වන්නේ ය.

**ජල මාපකය අලුත්වැඩියා කළ නොහැකි තත්ත්වයට පත්ව ඇති බව මණ්ඩලයට දැන්වීමට අයිතිකරුට ඇති යුතුකම.**

84ඇ. (1) මණ්ඩලය විසින් යම් ගොඩනැගිල්ලක හෝ ස්ථානයක සවි කරන ලද ජල මාපකයක් අලුත්වැඩියා කළ නොහැකි තත්ත්වයට පත්ව ඇති අවස්ථාවක දී, ඒ බව මණ්ඩලය වෙත වහාම දැන්වීම එම ගොඩනැගිල්ලේ හෝ ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරුගේ යුතුකම වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය මගින් තමා වෙත පවරන ලද කාර්යය ඉටු කිරීමට යම් අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු ඕනෑකමින් මගහරින හෝ අපහසුකරන අවස්ථාවක දී, ඔහු වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දස දහසකට නොවැඩි දඩයකට යටත් වන්නේ ය.

**ජල මාපකය කියවීමට ඇතුළුවන නිලධරයකුට බාධා කිරීම.**

84ඉ. මණ්ඩලය මගින් සවි කරන ලද ජල මාපකයක් කියවීමේ කාර්යය සඳහා යම් ගොඩනැගිල්ලකට හෝ ස්ථානයකට ඇතුළුවීමේ දී, තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් බලය පවරන ලද නිලධරයකුට සාධාරණ හේතුවක් නොමැතිව බාධා කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන් දහසකට නොඅඩු සහ රුපියල් දස දහසකට නොවැඩි දඩයකට යටත් වන්නේ ය.

**ජල මාපකය මග හැරීම වරදක් බව.**

84ඊ (1) යම් ගොඩනැගිල්ලක හෝ ස්ථානයක මණ්ඩලය විසින් සවිකර ඇති ජල මාපකය මග හරිමින් එම ගොඩනැගිල්ලට හෝ ස්ථානයට ජල සැපයුමක් ලබාගන්නා එම ගොඩනැගිල්ලේ හෝ ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දස දහසකට නොවැඩි දඩයකට යටත් වන්නේ ය.

(2) මණ්ඩලය විසින් ජල මාපකයක් සවිකරනු ලැබ ඇත්තේ යම් ගොඩනැගිල්ලක හෝ ස්ථානයකද එම ගොඩනැගිල්ලේ හෝ ස්ථානයේ අයිතිකරුට හෝ පදිංචිකරුට අවම වශයෙන් පැයක දැනුම් දීමකින් පසුව, එම ගොඩනැගිල්ලට හෝ ස්ථානයට ජල මාපකය මඟ හරිමින් ජලය සපයනු ලබන්නේ ද යන්න දැන ගැනීම සඳහා පෙරවරු හය සහ පස්වරු හය අතර කාලය තුළ සාමාන්‍යාධිකාරිවරයාට හෝ තත්කාර්යය සඳහා ලිඛිතව බලය පවරන ලද යම් තැනැත්තකුට එම ගොඩනැගිල්ලට හෝ ස්ථානයට ඇතුළු විය හැකි ය.

(3) යම් ගොඩනැගිල්ලක හෝ ස්ථානයක සවිකරන ලද ජල මාපකයක් මඟ හරිමින් එම ගොඩනැගිල්ලට හෝ ස්ථානයට ජල සැපයුම ලබාගෙන ඇති බවට සාමාන්‍යාධිකාරිවරයා හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් තැනැත්තකු සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලබන අවස්ථාවක දී, එම ගොඩනැගිල්ලට හෝ ස්ථානයට ලබාගෙන ඇති අවසර නොලත් ජල සැපයුම සාමාන්‍යාධිකාරිවරයා විසින් වහාම කපා හැරිය යුතු ය.

(4) (2) සහ (3) වන උපවගන්ති යටතේ සාමාන්‍යාධිකාරිවරයා වෙත පවරා ඇති කාර්ය ඉටු කිරීමේ දී සාධාරණ හේතුවක් නොමැතිව ඔහුට හෝ ඔහු විසින් තත් කාර්යය සඳහා ලියවිල්ලකින් බලය පවරන ලද යම් තැනැත්තකුට ප්‍රතිරෝධය පාන හෝ බාධා කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දස දහසකට නොවැඩි දඩයකට යටත් වන්නේ ය.

ජල මාපකයට අයුතු යමක් කිරීම ආදිය වරදක් බව.

84උ. මණ්ඩලය විසින් යම් ගොඩනැගිල්ලක හෝ ස්ථානයක සවිකරනු ලැබ ඇති යම් ජලමාපකයකට අයුතු යමක් කරන, එය කඩා දමන, විවෘත කරන, වෙනස් කරන, අලාභ කරන හෝ වෙනත් යම් ආකාරයකින් වැරදි සහගත ලෙස යමක් කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දස දහසකට නොවැඩි දඩයකට යටත් වන්නේ ය.

ජල මාපක ආදිය මණ්ඩලයේ දේපළ වන බව.

84ඇ. යම් ගොඩනැගිල්ලක හෝ ස්ථානයක සවි කර ඇති සියලු ජල මාපක ඒවායේ සියලුම අනුබන්ධනද මණ්ඩලයේ දේපළ ලෙස සලකනු ලැබිය යුතු ය.

ජල බද්ද ගෙවීමට පදිංචිකරු බැඳී සිටීම.

84එ. (1) මණ්ඩලය විසින් ජලය සපයනු ලද යම් ගොඩනැගිල්ලක හෝ ස්ථානයක පදිංචිකරු එම ගොඩනැගිල්ලට හෝ ස්ථානයට එසේ සපයන ලද ජලය සම්බන්ධයෙන් ගෙවිය යුතු සියලුම ගාස්තු ගෙවීමට බැඳී සිටී.

(2) යම් ගොඩනැගිල්ලක හෝ ස්ථානයක පදිංචිකරු කවුරුන්ද යන වග දැනගැනීමට මණ්ඩලය අපොහොසත් වන අවස්ථාවක දී, දැන්වීම් ලැබුණු දින සිට සති දෙකක් ඇතුළත පදිංචිකරුගේ නම මණ්ඩලයට හෙළිකරන ලෙස දන්වමින් සාමාන්‍යාධිකාරිවරයා විසින් එම ගොඩනැගිල්ලේ හෝ ස්ථානයේ අයිතිකරු වෙත ලිඛිත දැන්වීමක් යැවිය හැකි ය. සාධාරණ හේතුවක් නොමැතිව නියමිත කාලසීමාව ඇතුළත නියමිත හෙළිකිරීම සිදු කිරීමට අයිතිකරු අපොහොසත් වුවහොත්, ඔහු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසුව රුපියල් සියයක දඩයකට යටත් වන්නේ ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 91 වන වගන්තිය සංශෝධනය කිරීම.

34. ප්‍රධාන ප්‍රඥප්තියේ 91 වන වගන්තියේ ඇති " රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ බන්ධනාගාරගත කරනු ලැබීම හා දඩය යන දඬුවම් දෙකටම හෝ " යන වචන වෙනුවට " රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම හෝ " යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 97අ වගන්තිය ඇතුළත් කිරීම.

35. ප්‍රධාන ප්‍රඥප්තියේ 97 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 97අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය :—

" වැරදි සංඥේය සහ ඇප දිය නොහැකි වැරදි විය යුතු බව.

97අ. මේ පනතේ යම් විධිවිධානයක් යටතේ සිදු කරනු ලබන්නා වූ ද මෙහි උපලේඛනයෙහි නිශ්චිතව දැක්වෙන්නා වූ ද සියලු වැරදි, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද එය නොතකා, එම පනතේ අර්ථානුකූලව සහ එම පනතේ කාර්ය සඳහා—

(අ) සංඥේය වැරදි ලෙස ; සහ

(ආ) ඇප දිය නොහැකි වැරදි ලෙස

සලකනු ලැබිය යුතු ය. ".

**36.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

**37.** ප්‍රධාන ප්‍රඥප්තියේ අවසානයට පහත දැක්වෙන උපලේඛනය එකතු කිරීමෙන් එම ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය එකතු කිරීම.

" උපලේඛනය

(97අ වගන්තිය)

සංඥේය වන සහ ඇප දිය නොහැකි වැරදි

01. 27අ(2) වගන්තිය යටතේ වූ වරද
02. 31 වන වගන්තිය යටතේ වූ වරද
03. 32 වන වගන්තිය යටතේ වූ වරද
04. 33 වන වගන්තිය යටතේ වූ වරද
05. 34 වන වගන්තිය යටතේ වූ වරද
06. 36(2) වන වගන්තිය යටතේ වූ වරද
07. 38 වන වගන්තිය යටතේ වූ වරද
08. 54(2) වන වගන්තිය යටතේ වූ වරද
09. 62(3) වන වගන්තිය යටතේ වූ වරද
10. 66(5) වන වගන්තිය යටතේ වූ වරද
11. 67(1) වන වගන්තිය යටතේ වූ වරද
12. 84ආ වන වගන්තිය යටතේ වූ වරද
13. 84ඇ වන වගන්තිය යටතේ වූ වරද
14. 84ඉ වන වගන්තිය යටතේ වූ වරද
15. 84ඊ වන වගන්තිය යටතේ වූ වරද
16. 84උ වන වගන්තිය යටතේ වූ වරද
17. 91 වන වගන්තිය යටතේ වූ වරද.".

---

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 ක්. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ජීවං කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.